සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

**Provincial Department of Education - NWP**

| 84 | S | II |
|---|---|---|

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

**නම/විභාග අංකය : ..............................................** **ශිල්ප කලා - II** **කාලය : පැය 02යි.**

සැලකිය යුතුයි

**I පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න වලින් හතරක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. ජාතීන් අතර සංහිඳියාව ගොඩ නැගීමේ අරමුණ පෙරදැරිව සිංහල, දෙමළ සහ මුස්ලිම් පාසල් සහභාගි වන සංස්කෘතික උළෙලක් පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත.

(i) සංස්කෘතික උළෙල සඳහා පැමිණෙන ලෙස ආරාධනා කිරීමට සුදුසු ආරාධනා පත්‍රයක ආකෘතියක් සකස් කරන්න.

(ii) සංස්කෘතික උළෙල ඉදිරිපස දොරටුව අසල ප්‍රදර්ශනය කිරීමට සුදුසු පෝස්ටරයක් නිර්මාණය කරන්න.

(iii) සංවිධායක කමිටුව එකම වර්ණයකින් යුත් ඇඳුමකින් සැරසී සිටියහ. ඒ සඳහා දෙපාර්ශවයටම සුදුසු මෝස්තරයක් අඳින්න.

(iv) එම ඇඳුම් අලංකාර කිරීමට සුදුසු ක්‍රම ශිල්ප 02ක් නම් කරන්න.

(v) උත්සව සභාව දේශීය අමුද්‍රව්‍ය යොදා අලංකාර කර තිබුණි. ඇමතුම් පුවරුව අලංකාර කිරීමට සුදුසු ස්වභාවික ද්‍රව්‍ය 04ක් ලියන්න.

(vi) ජයග්‍රාහකයින්ට ප්‍රදානය කිරීමට සුදුසු ජ්‍යාමිතික හැඩතල යොදා නිර්මාණය කළ ජය සංකේතයක් නිර්මාණය කරන්න.

(vii) උත්සව සභාව දෙපස පුන්කලස් දෙකක් තබා තිබූ අතර එය නිර්මාණය සඳහා ගත හැකි මාධ්‍ය 02ක් නම් කරන්න.

(viii) මැටි භාණ්ඩ අලංකාර කරගත හැකි ක්‍රම ශිල්ප 02ක් ලියන්න.

(ix) ආරාධිත අමුත්තන්ගේ සංග්‍රහය සකස්කර තිබූ මේසයේ දමා තිබූ රෙද්ද අලංකාර කර තිබුණේ සායම් භාවිතයෙන් තොරවය. එවැනි ක්‍රම 02ක් නම් කරන්න.

(x) සංස්කෘතික උළෙලකට සුදුසු තේමා පාඨයක් ලියන්න. (ලකුණු 2 5 10 = 20)

02. ශ්‍රී ලාංකිකයන් වන අප සෞන්දර්ය අංගවලින් පරිපූර්ණ වූ සිව් සැට කලාවකට උරුමකම් කියන්නෙමු.

(i) ශ්‍රී ලාංකීය සිව්සැට කලාවේ ප්‍රධාන ප්‍රභේද 02ක් නම් කරන්න. (ල. 02)

(ii) ශ්‍රී ලාංකීය ජන කලා වර්ග 04ක් නම් කරන්න. (ල. 04)

(iii) ජන කලා කර්මාන්ත අතරින් ඔබ කැමති කර්මාන්තයක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ල. 04)

03. අප අවට පරිසරයේ සෑම දෙයකම ජ්‍යාමිතික හැඩතල දක්නට ලැබේ.

(i) ජ්‍යාමිතික නිර්මාණ සඳහා භාවිතා කරන රේඛා වර්ග 2ක් නම් කරන්න. (ල. 02)

(ii) $60^0$ කෝණයක් නිර්මාණය කර සමච්ඡේදනය කරන්න. (ල. 04)

(iii) ඩේලියා මලක් සෑදීම සඳහා අරය 3cmක් වූ වෘත්තයක් ඇඳ එය සමාන කොටස් 8කට බෙදන්න. (ල. 04)

04. අතීතයේ රෙදිපිළි වර්ණ ගැන්වීම සඳහා පාරිසරික සම්පත් භාවිත කල අතර වර්තමානයේ කෘතිම සායම් ද භාවිතා කෙරේ.

(i) අතීතයේ වර්ණ සැකසීමට භාවිත කළ ස්වභාවික අමුද්‍රව්‍ය 02ක් ලියන්න. (ල. 02)

(ii) වර්තමානයේ කෘත්‍රිම සායම් භාවිත කිරීමට හේතු 04ක් ලියන්න. (ල. 04)

(iii) කෘත්‍රිම සායම් භාවිත කර ඔබ කැමති රෙදි පිළි අලංකරණ ක්‍රමයට කොට්ට උරයක් අලංකාර කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල. 04)

05. ස්වභාවික කෙඳි අතරින් රෙදිපිළි නිෂ්පාදනයට භාවිතා කරන කෙඳි පෙහෙකම් කෙඳි ලෙස හඳුන්වයි.

(i) පෙහෙකම් කෙඳි වර්ගකර දක්වන්න. (ල. 02)

(ii) චාම් වියමනේ ප්‍රභේද නම්කර ඉන් වියාගන්නා රෙදි වර්ග 2 බැගින් ලියන්න. (ල. 04)

(iii) ඔබ කැමති චාම් වියමනේ ප්‍රභේදයක් ඇඳ නම් කරන්න. (ල. 04)

06. ස්වභාවික සම්පතක් ලෙස සලකන මැටි පදම් කර ගැනීමෙන් පසු විවිධ නිර්මාණයන් සඳහා යොදා ගැනේ.

(i) පදම් මැටි මිශ්‍රණයක ඇති විශේෂ ගුණාංග 2ක් ලියන්න. (ල. 02)

(ii) පදම් මැටි භාවිතයෙන් කරන මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රම 4ක් නම් කරන්න. (ල. 04)

(iii) ඉහත ඔබ නම් කළ එක් ක්‍රමයක රූප සටහනක් අඳින්න. (ල. 04)

07. ඇඳුම් පැළඳුම් අලංකාර කිරීම සඳහා විවිධ උපාංග භාවිතා කරයි.

(i) වෙළඳපොලින් අප ලබාගන්නා රිබන් පළල අනුව වර්ග කර ඇත්තේ කොටස් කීයකට ද?
ඒ මොනවා ද? (ල. 02)

(ii) ප්‍රංශ ගැට මැස්ම මසා ගන්නා ආකාරය රූප සටහනක් සහිතව විස්තර කරන්න. (ල. 04)

(iii) පබළු භාවිතයෙන් විසිතුරු ඇඳුම් අලංකාර කරයි. පබළු භාවිතා කර කරනු ලබන ඇඳුම් අලංකරණ 04ක් නම් කරන්න. (ල. 04)